# පිපිඤ්ඤා

## *කුකුමිස් සැටයිවස්* (*Cucumis Sativus*)

## කුලය - කුකර්බිටේසී

ඉතා ජනප්‍රිය එළවළු බෝගයකි. සම්ප්‍රදායික ලෙස පිස ගත් ආහාරයක් වශයෙන් හා සලාද ආකාරයට ආහාරයට ගනු ලැබේ.

### දේශගුණික අවශ්‍යතා

තෙත් කලාපයේ වසර පුරාම ද, වියළි කලාපයේ මහ කන්නයේදී ද වගා කළ හැකිය. මෙම බෝගය මුහුදු මට්ටමේ සිට මීටර් 1000 පමණ උස් වූ ප්‍රදේශ දක්වා වගා කළ හැකිය. උෂ්ණ පරිසර තත්ව ප්‍රියකරන බෝගයකි. බෝගයේ වර්ධනය සාර්ථක වීම සඳහා පැවතිය යුතු ප්‍රශස්ථ උෂ්ණත්වය සෙ.ග්‍රේ. $30^0$ පමණ වේ.

### පස

විවිධ ආකාරයේ පස් වර්ග පවතින ඉඩම් වල පිපිඤ්ඤා, වගාකළ හැකිය. කාබනික ද්‍රව්‍ය මැනවින් අඩංගු හොඳින් ජලවහනය වන පස වගාව සඳහා වඩා සුදුසුය. පසෙහි දිගු කාලයක් ජලය රඳා පැවතීමේ තත්වයට බෝගය ඉතා සංවේදීය. සුදුසු පී.එච්.අගය 5.5-7.5 වේ.

### බිම් සැකසීම

ඉඩමේ වල් පැල ඉවත් කර සෙ.මී.30×30×30 ප්‍රමාණයේ වලවල් නියමිත පරතරයට සකසන්න. දිරාපත්වූ කාබනික පොහොර කි.ග්‍රෑ. 3 පමණ, මතුපිට පස් සමඟ කළවම්කර වලවල් පුරවා ගන්න. පොළව මට්ටමේ සිට සෙ.මී.10 පමණ උසට සිටින සේ මෙම මිශ්‍රණයෙන් වලවල් මුදුන් කර ගන්න.

### නිර්දේශිත ප්‍රභේද

එල්.වයි.58 - ගෙඩිය කහපාටය. කළුපැහැති නෙරුම් ඇත. මධ්‍යම විශාලත්වයක් සහිත ගෙඩි සිලින්ඩරාකාරය.

### බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1

ග්‍රෑමයක බීජ 30-40 අඩංගු වේ.

### පරතරය

තනි වගාවක් සඳහා මීටර් 1 × මීටර් 1

බණ්ඩක්කා සමග මිශ්‍ර වගාවක් ලෙස ද පිපිඤ්ඤා වගාකළ හැකිය. එවිට ලබාදිය යුතු පරතරය සෙ.මී.120×90 කි. එකම වලෙහි බෝග දෙකටම අයත් බීජ සිටුවන්න.

### පැළ තුනී කිරීම

එක වලක පැළ 2 පමණක් ඉතිරිවන ලෙස සති 2 දී වැඩි පැළ ගලවා දමන්න.

### පොහොර යෙදීම

| | යූරියා<br>හෙක්.කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට්<br>හෙක්.කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ<br>හෙක්.කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 75 | 200 | 60 |
| පැළ මතුවී සති 2 පසු | 75 | - | 60 |
| පැළ මතුවී සති 5 පසු | 75 | - | 60 |

### වල් පැළ පාලනය

බෝගය විසින් පොළව වසාගන්නා තෙක් වගාවේ වල් පැළ පාලනය කිරීම පිළිබඳව සැලකිලිමත් වන්න. පිදුරු හෝ වියළි තණකොළ වැනි වසුන් යෙදීමෙන් ද වල් පැලවල වර්ධනය පාලනය කරගත හැකිය.

### ජල සම්පාදනය

බෝගයට අනවශ්‍ය පරිදි ජලය සැපයීම සුදුසු නැත. පසෙහි තෙතමනය වැඩි වූ විට වැල් හා ගෙඩි කුණුවී යා හැකිය. එනිසා වගාව යටවන පරිදි ජලය හැරවීම නොකරන්න. වැල පාමුලට අතින් ජලය ලබාදීම හෝ කානු දිගේ වගාවට ජලය ලබාදී සෙමින් පසට උරාගැනීමට සැලැස්වීම හෝ කරන්න. වගාවේ පිදුරු වැනි වසුනක් යෙදීමෙන් පස වියළීයාම අඩුකර ගත හැකිය.

### පරාගනය

මල් පරාගනය වන්නේ ප්‍රධාන වශයෙන් මී මැස්සන් මගිනි. ගෙඩි හටගන්නා මල් ඇතිවන්නේ පිරිමි මල් හටගැනීම ආරම්භ වූ වාට පසුවය. වැඩි උෂ්ණත්වය සහ දිගු දිවාකාල පැවතීම මගින් ගෙඩි හටගන්නා මල් ඇතිවීම ප්‍රමාද කරයි.

## කෘමි පාලනය

### අවුලකපෝරා කුරුමිණියා

වැඩුන කුරුමිණියා විසින් පත්‍ර හා මල් ආදිය ආහාරයට ගනී. එමගින් ලපටි පැල සම්පූර්ණයෙන්ම විනාශ විය හැකිය. එසේම පැල ලපටි කාලයේදී, කීටයින්ගේ හානියට ද ගොදුරු විය හැකිය.

කාබරිල් 85% වැනි නිර්දේශිත කෘමිනාශක් අවශ්‍ය විට, සති 2 කට වරක් බැගින් යොදන්න.

### එපිලැග්නා කුරුමිණියා

වැඩුන කෘමියා සහ කීටයා පත්‍ර ආහාරයට ගනී

ට්‍රයික්ලෝෆෝන් (ඩිප්ටරෙක්ස් 50%) නිර්දේශිත අන්දමට වගාවට යොදන්න.

### පළතුරු මැස්සා

කීටයින් විසින් ගෙඩි ඇතුලත සිදුකරන හානිය නිසා ගෙඩි කුණුවී වැටී යයි.

පිලා අවධිය විනාශ කිරීමට පස අවුස්සන්න. හානිවූ ගෙඩි වගාවෙන් ඉවත්කර විනාශකර දමන්න. ෆෙන්තියෝන් 50% කෘමිනාශකය මල් හටගන්නා අවස්ථාවේ සිට සති 2 වරක් වගාවට යොදන්න. ජලය සමඟ මිශ්‍රකරගත් කෘමිනාශක මිශ්‍රණයේ සෑම ලීටරයකටම සීනි ග්‍රෑම් 25 බැගින් කළවම් කර යෙදීම වඩා සුදුසුය.

### රතු මයිටාවන්

යුෂ උරාබීම නිසා පත්‍රවල කොළ පැහැය අඩුවී දුඹුරු පැහැවී පහසුවෙන් කැඩෙන සුළු ස්වභාවයකට පත් වේ.

ඩයිමෙතොඒට් 40% නිර්දේශිත පරිදි යොදන්න.

### කුඩිත්තා හා සුදු මැස්සා

විචිත්‍ර වෛරස් රෝගය පතුරවන වාහකයන් වේ. රෝගී ශාක ගලවා විනාශකර දමන්න. ඩයිමෙතොඒට් 40% කෘමිනාශක සති 2 වරක් බැගින් යොදන්න.

## රෝග පාලනය

### යටි පුස් රෝගය

වර්ෂාකාලවලදී වැළඳිය හැකි දරුණුම රෝගයයි. රෝගය දරුණුවත්ම පත්‍ර හැලී යයි. පළමුව කහපැහැති කෝණාකාර පුල්ලි හටගන පසුව දුඹුරුපාට වේ. පත්‍රයේ යටි පැත්තේ අළු පැහැති බිජාණු දැකිය හැකිය.

ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) කැප්ටාන්, මැන්කොසෙබ්, මැනෙබ් වැනි දිලීර නාශකයක් සති 2 වරක් බැගින් වගාවට යොදන්න.

### පිටිපුස් රෝගය

වැඩි පරිසර උෂ්ණත්වයක් පවතින අවස්ථාවලදී වැළඳිය හැකි රෝගයකි.

රෝගී පත්‍ර කහපාට වේ. පත්‍රයේ දෙපසම සුදු පැහැති බිජාණු දැකගත හැකිය. ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) වැනි දිලීර නාශකයක් රෝගය දරුණු අවස්ථාවලදී සති පතා යොදන්න.

### මෘදු කුණුවීම

කඳෙහි පාමුල සහ පොළව සමඟ ස්පර්ශ වී ඇති ගෙඩිවල මෘදු කුණුවීමක් ඇති වේ. වගාව තුළ ජලවහනය දියුණු කරන්න.

### ඇන්ත්‍රැක්නෝස් රෝගය

බෝගයේ සියළුම වායව කොටස්වලට වැළඳිය හැකිය. පත්‍රවල පළමුවෙන් කුඩා කහපාට පුල්ලි හෝ තෙත් පැල්ලම් ඇතිවී පසුව ක්‍රමයෙන් විශාල වේ. විශාල පුල්ලිවල මැද සිදුරුවේ. ගෙඩිවල ගිළුනු තෙත් පැල්ලම් හටගනී.

ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) වැනි දිලීර නාශකයක් නිර්දේශිත අන්දමට යොදන්න.

## අස්වැන්න නෙළීම

ගෙඩි කහ පැහැවී ඇතිවිට නෙලාගන්න. පිහියක් වැනි ආයුධයකින් ගෙඩියේ නටුව කපාගන්න. වැල්වල පාර්ශ්වික ශාකා සියල්ල වැඩීමට ඉඩ හැරියවිට හටගන්නා ගෙඩි, ප්‍රමාණයෙන් කුඩාවේ. අස්වනු නෙලන වාර ගණන වැඩිකළවිට වැඩි අස්වැන්නක් ලබාගත හැකිය.

## අස්වැන්න

හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 20,000 - 25,000

## අස්වැන්න සැකසීම

නෙලාගත් ගෙඩිවල ගුණාත්මය අඩු නොවී සතියක් පමණ කාලයක් තබාගත හැකිය. මෙයට වඩා කල්ගතවූ ගෙඩි හැකිළීමට පටන්ගන්නා අතර අප්‍රසන්න රසයක්ද ඇති කරයි.